# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,691– 1959 මාර්තු 6 වැනි සිකුරාද—6.3.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## II වැනි කොටස—අධිකරණ

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබාගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පණත් ... ... ... | — | පිස්කල් විකිණීම් ... ... ... | — |
| ශ්‍රෙෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | 91 | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| වස්තුභංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## ශ්‍රෙෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ප්‍රකාශපත්‍රයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1959 ක්වූ මාර්තු මස 20 වෙනි දින පෙරවරු 11 පැය පටන් කළුතර තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත.—එහි යම් කාරණා ඇතුව සිටින සැම දෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ජී. පී. තම්බයියා,
බස්නාහිර දිසාවේ පිස්කල් වම්ශ,

වර්ෂ 1959ක්වූ මාර්තු මස 4 දින,
කොළඹ පිස්කල් කන්තෝරුවේදිය.

---

### ප්‍රකාශපත්‍රයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොට ගෙණ මෙයින් ප්‍රකාශකරන්නේ නම් මධ්‍යම කොට්ඨාශයේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1959 ක්වූ මාර්තු මස 10 වෙනි දින පෙරවරු 11 පැය පටන් මහනුවර තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත.—එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනා. ..ම්,
මධ්‍යම දිසාවේ පිස්කල් වර්.

වර්ෂ 1959ක්වූ පෙබරවාරි මස 28 දින,
මහනුවර පිස්කල් කන්තෝරුවේදිය.

### ප්‍රකාශපත්‍රයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන්මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොට ගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් මධ්‍යම ප්‍රාදේශික ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1959ක්වූ මාර්තු මස 10 වෙනි දින පෙරවරු 11 පැය පටන් මහනුවර තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත.—එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ඒ. ඇල්. පෙරේරා,
වයඹ පළාතේ පිස්කල් වම්ශ.

වර්ෂ 1959ක්වූ පෙබරවාරි මස 26 දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදිය.

---

### ප්‍රකාශනයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරු ශ්‍රෙෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට උතුරු මධ්‍යම පළාත සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1959ක්වූ මාර්තු මස 10 වන දින පෙරවරු 11 ට මහනුවර පිහිටි අධිකරණ ශාලාවේ දී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටවී නොයන ලෙසත්, මේ නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාට ම මම මෙයින් නියමකොට දැනුම් දෙමි.

ඩී. සී. ඇල්. අමරසිංහ,
උ. ම. දි. පිස්කල්.

වර්ෂ 1959 ක්වූ පෙබරවාරි මස 26 වන දින,
අනුරාධපුර පිස්කල් කන්තෝරුවේදිය,


91—ජේ. ඇන්. බී 12294—1,312 (2/59)

## ප්‍රකාශනයයි

ශ්‍රී ලංකාද්විපයේ ගරු ශ්‍රෙෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබේන අධිකරණ විධානයක බලය පිට මධ්‍යම කොට්ඨාශය සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වෂී 1959ක් වූ මාර්තු මස 10 වන දින පෙරවරු 11ට මහනුවර අධිකරණ ශාලාවේ දී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තවද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටවී නොයන ලෙසත්, මේ නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාට ම මම මෙයින් නියමකොට දැනුම් දෙමි.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
ඌව දිසාවේ පිස්කල්.

වෂී 1959ක් වූ පෙබරවාරි මස 26 වන දින,
පිස්කල් කන්තෝරුවේදීය.

## ප්‍රකාශනයයි

ශ්‍රී ලංකාවිපයේ ගරු ශ්‍රෙෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට මධ්‍යම දිස්ත්‍රික්කය සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1959 ක් වූ මාර්තු මස 10 වන දින පෙරවරු 11ට මහනුවර අධිකරණ ශාලාවේ දි පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටවී නොයන ලෙසත්, මේ නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාට ම මම මෙයින් නියමකොට දැනුම් දෙමි.

එල්. බී. අභයරත්න,
ස. ප. පිස්කල්.

වර්ෂ 1959ක් වූ මාර්තු මස 2 වන දින,
රත්නපුර පිස්කල් කන්තෝරුවේදීය.

**දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා **1955 ජනවාරි 1 වැනි දින** සිට අය කරන ගාස්තු මෙසේ යි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාදා පස්වරු 4ට ප්‍රථමයෙන්).**

**13. ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. පරණ ගැසට් කොපි තිබේනම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී